විල්පත්තු රක්ෂිත වනාන්තර කලාපය ආසන්නයේ පිහිටි කල්ලාරු රක්ෂිතය එළිපෙහෙලි කොට ජනාවාස ඉදිකිරීම පිළිබඳ අභියාචනාධිකරණය ලබාදුන් තීන්දුව සම්බන්ධයෙන් පුවත්පත් තුළ පුවත් වාර්තා පළ වී තිබිණි.

එම තීන්දුව සහිත වාර්තාව තුළ සඳහන් වන්නේ, [රටේ] අභ්‍යන්තරව අවතැන්වූවන් (IDPs) නැවත පදිංචි කරවීම සඳහා විල්පත්තු ජාතික වනෝද්‍යානයේ උතුරු රක්ෂිතය හෙළිපෙහෙළි කළ බවයි. සිලෝන් ටුඩේ පුවත්පත ඒ සම්බන්ධයෙන් සිදුකළ පුවත් ආවරණය තුළ, එම කරුණ නිවැරදිව දැක්වී තිබිණි.

කෙසේ නමුත්, සිලෝන් ටුඩේ හිමිකාරීත්වය ඇති පුවත්පත් සමාගමටම අයත් සිංහල භාෂා පුවත්පත වන මව්බිම ප්‍රධාන සිරස්තල පුවත වෙත එය පැමිණ ඇත්තේ, "...තම නෑ හිතවතුන් ඒවායෙහි බලහත්කාරයෙන් පදිංචි කිරීමත් මගින් වගඋත්තරකාර රිෂාඩ් බදියුදීන් කර ඇත්තේ බරපතළ අපරාධයක් බවත් අභියාචනාධිකරණය ඊයේ (16දා) නඩු තීන්දුවක් දෙමින් ප්‍රකාශයට පත් කළේය" යනුවෙනි. එනමුත්, නඩු තීන්දු වාර්තාව තුළ එවැනි කිසිදු සඳහනක් නොමැත.

එසේ නම්, අභියාචනාධිකරණ තීන්දුව මූලාශ්‍ර ලෙසින් සඳහන් කරමින් මව්බිම පුවත්පත පළ කර ඇත්තේ සාවද්‍ය සහ පාඨකයා නොමඟ යවන තොරතුරු යැයි ඔබ සිතන්නේද? එසේ නම්, එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් සේම, නිරවද්‍ය වාර්තාකරණය සඳහා වන මාධ්‍ය වගකීම පැහැර හැරීමක්ද නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #SMawbima #CeylonToday**